Australian Red Cross

redcross.org.au/workrighthub

# ඔස්ට්‍රේලියාව තුළ නූතන වහල් සේවය සිදුවෙයි



නූතන වහල් සේවය යනු බලහත්කාරය, තර්ජනය හෝ රැවටීම උපයෝගී කරගනිමින් පුද්ගලයන් සූරාකෑම හා ඔවුන්ගේ නිදහස පැහැර ගැනීමයි. මේවා ඔස්ට්‍රේලියාව තුළ බරපතල අපරාධ වන අතර එයට පුද්ගල ජාවාරම, වහල් සේවය, දාසබව, බලෙන් විවාහ කරවීම, බලෙන් සේවයේ යෙදවීම, ණය බැඳුම්කර, ඉතාම බැරෑරුම් ආකාරවල ළමා වහල් සේවය හා වංචාවෙන් කම්කරු සේවය සඳහා බඳවා ගැනීම ආදිය ඇතුළත් වේ.

## ඔබ හෝ දන්නා කෙනෙක් සූරා කෑමට ලක්වන්නේ නම්, උදව් තිබේ.

තොරතුරු දැන ගැනීමට හෝ රහසිගතව උපදෙස් ලබා ගැනීමට ඔස්ට්‍රේලියා රතු කුරුස සංගමය අමතන්න. දුරකථන 03 9345 1800 හෝ ඊමේල් national_stpp@redcross.org.au

# සේවා ස්ථානයේ දී ඔබට සාධාරණව සැලකිය යුතුය



## ඔබ හෝ දන්නා කෙනෙක්ගෙන්:

- බලෙන් වැඩ ගැනීම
- ඉතාම කෙටි විවේකයක් දෙමින් දිගු පැය ගණනක් වැඩ ගැනීම
- නිසියාකාරව වැටුප් නොගෙවීම.
- ගමන් වියදම්, නවාතැන්, නිල ඇඳුම්, ප්‍රවාහනය හෝ රැකියා ලියකියවිලි සඳහා බඳවා ගන්නෙකුට හෝ සේවා යෝජකයකුට විශාල ණයක් ගෙවමින් සිටීම
- සේවා ස්ථානයෙන් අස්වී යා නොහැකි වීම හෝ තත්ත්වයන් වෙනස් විසදා ගත හැකි නොවීම
- සේවා ස්ථානයේ දී පිටුවහල් කරන බව හෝ පවුලේ අයට හානි සිදු කරන බව කියමින් පොලඹවා ගැනීම හෝ තර්ජනය කිරීම සිදුවීම
- ඔබේ ගමන් බලපත හෝ සෙසු අනන්‍ය ලේඛන ලබා ගත නොහැකි වීම
- නිවෙසක වැඩ කරන අයෙකුට පුද්ගලික හා සමාජයීය අවස්ථා සඳහා කලාතුරකින් පමණක් පිටතට යාමට ඉඩ දීම
- අපහාස, අවමාන, හිංසන, හෝ ප්‍රචණ්ඩත්වයට භාජනය කිරීම සිදු වන්නේ නම්

## උදව් තිබේ

රතු කුරුස සංගමය මගින් උපදේශ හා උපකාර ලබා දෙන අතර උදව් සඳහා ඔබව වෙනත් සේවාවන් වෙත ද යොමු කළ හැකිය. භාෂණ පරිවර්තක සේවා තිබේ. **03 9345 1800 ඔස්සේ අමතන්න නැත්නම් national_stpp@redcross.org.au හරහා ඊමේල් කරන්න.**

පුද්ගලයන්ට පිළිලැබීමට හා සිය ජීවිත නැවත ගොඩනගා ගැනීමට **උපකාර කරන වැඩසහටනක්** වේ. මෙම වැඩහටහන මගින් පුද්ගලයන්ට ජීවත් වීමට ආරක්ෂිත ස්ථානයක් සොයා ගැනීමට, වෛද්‍ය රැකවරණ, උපදේශන, නෛතික සේවා හා සංක්‍රමණ උපදෙස් ලබා ගැනීමට, මූල්‍ය ආධාර, අධ්‍යාපනය හා පුහුණුව හෝ රැකියාවක් සොයා ගැනීමට හා සමාජ සම්බන්ධතා සඳහා උපකාර කරයි. මේ වැඩසටහන ගැන වැඩිදුර විස්තර රතු කුරුස සංගමය වෙතින් ලබා ගත හැකිය.*

හදිසි අවස්ථාවක දී හෝ කිසිවකු ගේ ආරක්ෂාවට තර්ජනයක් ඇත්නම් **000** ඔස්සේ පොලිසිය අමතන්න. නූතන වහල්භාවය විය හැකි අවස්ථාවක් ගැන වාර්තා කිරීමට **131 237** ඔස්සේ ඔස්ට්‍රේලියා ෆෙඩරල් පොලිසිය අමතන්න.

## ඔබේ අයිතිවාසිකම් දැන සිටින්න

ඔස්ට්‍රේලියාවේ සියලු සේවකයන්ට මූලික අයිතීන් ඇති අතර ඔවුන් නීතිය මගින් ආරක්ෂා කොට ඇත. මෙම නීති මගින්, විදේශයන් සිට පැමිණ සිටින සේවකයන් ද ඔවුන් මෙහි සිටින කාලය හෝ වීසා කාණ්ඩය නොසළකමින් ආවරණය කරනු ලබයි.

සේවා ස්ථානයේ ඔබේ අයිතිවාසිකම් දැනගැනීමට **www.fairwork.gov.au** වෙත යන්න. නැත්නම් **13 13 94** ඔස්සේ ඔම්බුඩ්ස්මන් අමතන්න. භාෂණ පරිවර්තකයකු අවශ්‍ය නම් **13 14 50** ඔස්සේ පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව අමතන්න.

*ප්‍රචාරම්වලට ලක්වූවන් සම්බන්ධ වැඩසටහනට සහයෝගය දැක්වීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ඔස්ට්‍රේලියා රතු කුරුස සංගමයට අරමුදල් සපයයි.

*This Modern Slavery grant activity received grant funding from the Australian Government.*